ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date: 2021.01.13

පැමිණිලි පාර්ශවය : සුසන්ත කුමාර මයා,
ගෝනෑව,
කල්ලන්චිය.

වගඋත්තර පාර්ශවය : අධ්‍යක්ෂ,
නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය,
යුධ හමුදා මූලස්ථානය,
කොළඹ.

<u>පැමිණිලි අංකය : HRC/AP/147/2018(R)</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා 1996.04.25 වන දින ශ්‍රී ලංකා යුධ හුමදාවට බැදී සේවය කරන ලද බවත්, වසර 22 ක සේවා කාලයකින් පසුව 2018.05.19 වන දින විශ්‍රාම ගැන්වීමට අවශ්‍ය කටයුතු සලසන ලද බවත්ය.

වසර 22 ක සේවා කාලය සම්පූර්ණ වීමෙන් පසු විශ්‍රාම වැටුප සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමේදී, 2007 වසරේ අනුරාධපුර රණසේවාපුර යුධ හුමදා කඳවුරේ සේවයේ නියුතු කාල වකවානුව තුළදී යුධ හමුදා කඳවුරේ භාණ්ඩ කඳවුරෙන් පිට කිරීම සම්බන්ධයෙන් සිදු කළ මූලික පරීක්ෂණ උසාවියකදී වරද පිළිගැනීමට අදාළව යුධ හමුදාපතිවරයාගේ නිගමනය අනුව යුධ හමුදා සේවයෙන් 2009.07.31 දින සිට ඉවත් කිරීමට නියෝග ලද බවත් දක්වා ඇත.

නමුත් එම නියෝගය අනුව තමන්ව යුධ හුමදාවෙන් ඉවත් නොකළ බවත්, 2018.05.19 වන දින වසර 22 ක සේවා කාලය සම්පූර්ණ වනතෙක් යුධ හමුදාවේ සේවය කිරීමට සිදුවූ බවත්, වසර 22 ක සේවා කාලය සම්පූර්ණ කර සේවයෙන් ඉවත් වන අවස්ථාවේ විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දෙන




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ලෙස වගඋත්තරකරුවන්ගෙන් ඉල්ලීමක් කළ නමුත් තමාට හිමි විශ්‍රාම වැටුප ලබා දීමට කටයුතු නොකළ බවත් සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරුගේ අංක යුහ/නීති/350/1757(09) හා 2018.08.16 දිනැති වාර්තාව මගින් දන්වා ඇත්තේ, මෙම පැමිණිලිකරු යුධ හමුදා නිල ඇඳුම් සහ බූට් යුවල් ලබා ගෙන වංචා සහගත ලෙස සිවිල් ආයතනයකට අලෙවි කිරීම සම්බන්ධ මූලික පරීක්ෂණ උසාවියක් පවත්වා යුද්ධ හමුදාපති විසින් ලබා දෙන ලද 2009.07.31 දිනැති නිගමනය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කර රුපියල් 22,915.45 ක මුදලක් ඔහු වෙතින් අය කර ගැනීමෙන් අනතුරුව තවදුරටත් සේවය අනවශ්‍ය හේතුව මත යුද්ධ හමුදාවෙන් ඉවත් කරන ලෙස විධාන කර ඇති බවය.

එම යුද්ධ හමුදාපති නිගමනය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමේදී පැමිණිලිකරු රාජකාරී කරන ලද 58 සේනාංක මූලස්ථානයේ ආයුධාගාරය හදිසි ගිනි ගැනීමකට ලක්ව පැමිණිලිකරුට අයත් අංක 1202974 දරණ ගිනි අවියද විනාශ වී ඇති බව පැමිණිලිකරුගේ රෙජිමේන්තුවට සහ ඒකකයට 58 සේ.මු විසින් 2009.10.09 දිනැති ලිපිය මගින් දන්වා යැවීම හේතුවෙන් පැමිණිලිකරු යුද්ධ හමුදාවෙන් ඉවත් කිරීම සඳහා නිශ්කාශන ලබා දීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බවද සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් පවත්වන ලද මූලික පරීක්ෂණ උසාවිය වෙනුවෙන් ලබා දී ඇති යුද්ධ හමුදාපති නිගමනය අනුව ගිනි ගැනීම හේතුවෙන් විනාශ වී ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා ඒකකයට අයත් අවි පොත්පත්වලින් කපා හැරීමට කටයුතු කරන මෙන් විධානය කර ඇතත්, ගිනි අවි 12 ක් නිරාකරණය කර ඉදිරිපත් කර ඇති ලිපියේ අවි ගණනින් 12 කට අයත් අංක පමණක් සටහන් කර තිබී ඇති බවත්, එම අවි අයත් අයවළුන්ගේ විස්තර එම ලිපියේ සඳහන්ව නොතිබීම හේතුවෙන් පැමිණිලිකරුගේ රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙතින් පැමිණිලිකරුගේ පුද්ගලික ලිපිගොනුවට ගිනි අවිය සබැඳි ගැටළුව නිරවුල් වූ බවට අදාළ ලිපි ලේඛන ඇතුළත් කිරීමට කටයුතු කර නොමැති බවත් දක්වා ඇත.

කරුණු එසේ තිබියදී පැමිණිලිකරුගේ වසර 22ක යුද්ධ හමුදා සේවා කාලය අවසන් වීමට නියමිත හෙයින් ඔහුගේ නිෂ්කාශන ලබා ගැනීමට රෙජිමේන්තු කරන ලද අවස්ථාවේදී විනාශ වූ ගිනි අවිය සබැඳිව නිරාකරණය නොවූ බව තිරණය වීමෙන් පසු අදාළ පරීක්ෂණ සමවායකට පත් කොට ඔහු සබැඳි ඉදිරි පාලන කටයුතු සිදු කිරීම සඳහා අදාළ ස්ථාන වෙත දැනුම් දී ඇති බවත් දක්වා ඇත.

මෙම පැමිණිලිකරු විශ්‍රාම ගැන්විය හැකිද යන්න සලකා බැලීමේදී, පැමිණිලිකරු සබැඳිව පවත්වන ලද මූලික පරීක්ෂණ උසාවි වාර්තාවට ලබා දී ඇති යුද්ධ හමුදාපති නිගමනය අනුව ඔහු යුද්ධ හමුදාවෙන් අස් කිරීමට විධානය කර ඇති හෙයින් පැමිණිලිකරු යුදධ හමුදාවෙන් විශ්‍රාම ගැන්වීමට කිසිදු නෛතික හැකියාවක් නොමැති බවත්, එසේ සිදු කරන්නේ නම් යුද්ධ හමුදා පිළිවෙතට අනුව යුද්ධ හමුදාපති වෙත කරුණු ඉදිරිපත් කර යුද්ධ හමුදාපති විසින් ලබා දෙනු ලබන විධානය/ නිර්දේශය අනුව කටයුතු කළ යුතු බවත් නීති සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පැමිණිලිකරුගේ රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත උපදෙස් ලබා දී ඇති බවත් දක්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, තමන් යුධ හමුදාවේ සේවයට බැඳී වසර 22 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු යුධ හමුදා සේවයෙන් විශ්‍රාම ලබා ගැනීමට ඉල්ලුම් කළ බවත්, 2009.07.31 දිනැති යුධ හමුදාපතිගේ නිගමනය අනුව තමන්ට විශ්‍රාම වැටුප් හිමිකම් නොලබන බවට යුධ හමුදාව විසින් දැනුම් දී ඇති බවත්ය.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිල්ලකරු විසින් යුද හමුදා සේවයේ සිටියදී සිදු කරන ලද වරදක් හේතුවෙන් මූලික පරීක්ෂණ උසාවියක් පවත්වා අනතුරුව යුධ හමුදාපතිගේ 2009.07.31 දිනැති නිගමනය මගින් පැමිණිලිකරුව යුද හමුදා සේවයෙන් ඉවත් කිරීමට නියෝග ලබා දී ඇති බැවින් පැමිණිලිකරුට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම යුධ හමුදා පිළිවෙතට අනුව කළ නොහැකි බවය.

පැමිණිලිකරුගේ හා වගඋත්තරකරුගේ තොරතුරු සලකා බැලීමේදී පැමිණිලිකරු යුධ හමුදා සේවයේ වසර 22 ක් සම්පූර්ණ කර ඇත්තෙකු බව නිරීක්ෂණය වේ. එමගින් නිරීක්ෂණය වනුයේ, 2009.07.31 දරණ යුධ හමුදාපති නියෝගය ක්‍රියාත්මක නොමැති බවත්, පැමිණිලිකරු අඛණ්ඩව සේවයෙහි යෙදී ඇති බවත්ය. මේ ආකාරයෙන් පැමිණිලිකරුගේ සේවය පුරා වසර 22ක් පුරාවට ලබාගෙන ඔහු විශ්‍රාම යන අවස්ථාවේදී ක්‍රියාත්මක නොකරන ලද යුධ හමුදාපති නියෝගයක් පදනම්ව පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප ලබා නොදීම බලවත් අසාධාරණයක් වේ. එසේ වනුයේ යුධ හමුදාපති නියෝගය ක්‍රියාත්මක නොවී ඔහු තම කාලය හා ශ්‍රමය වැය කරමින් තම සේවාව යුධ හමුදාව වෙත ලබාදීමෙන් සහ අදාළ වර්ෂයන් සම්පූර්ණ කිරීම තුළින් ඔහු තුළ සාධාරණ සහ නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇති වන බැවිනි. යුධ හමුදාපති නියෝගය ක්‍රියාත්මක නොවී ඔහු තවදුරටත් සේවයෙහි යෙදී සිටින විට සහ විශ්‍රාම වැටුප ඔහු සේවය කළද ලබා නොදෙන බව ඔහු වෙත දන්වා නොමැති පසුබිමක් තුළ ඔහු තුළ විශ්‍රාම වැටුපක් ලබාගැනීමට ඇතිවන අපේක්ෂාව සාධාරණ සහ යුක්ති සහගත වේ. ගිනිගන්ගල මොහන්දිරම්ලාගේ නිමලසිරි එදිරිව කර්නල් පී.පී.ජේ ප්‍රනාන්දු සහ වෙනත් අය SC FR Application No 256/2010 නඩු තීන්දුවෙහි

සඳහන් වනුයේ' "නීත්‍යානුකූල අපේක්ෂාව ආරක්ෂා කිරීම යන අවස්ථාවන් සඳහා නීත්‍යානුකූල අපේක්ෂාව පිළිබඳ මූලධර්මය අදාළ වන බවත්, එවැනි නීත්‍යානුකූල අපේක්ෂාවක් පැනනගිනුයේ මහජන නිලධාරියෙකු විසින් දෙනු ලබන පොරොන්දුවක් හෝ යම් කාර්යයක් පිළිබඳ විශ්වාසයන් හෝ යම් අධිකාර්ය ස්ථාපිත පිළිවෙත් පිළිබඳ අපේක්ෂාවක් ඇතිවීම තුළින්" යනුවෙනි.

ඒ අනුව පැමිණිලිකරු යුධ හමුදාවට සම්බන්ධ වන අවස්ථාවේදී ඇතිකරගත් ගිවිසුම් සහ මෙතෙක් කල් යුධ හමුදාව තුළ පැවැති විශ්‍රාම වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් පැවැති ස්ථාපිත පිළිවෙත් මගින් ඔහුට පුරා වසර 22 ක සේවයක් ලබාදීමෙන් පසු විශ්‍රාම වැටුපක් පිළිබඳව අපේක්ෂාවක් ඇති වීම සාධාරණ සහ යුක්ති සහගත වේ. එසේ වනුයේ කිසිදු අවස්ථාවක ඔහු සේවය සපයන ලද කාල රාමුව තුළ ඔහු විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් නොලබන බව ඔහුට දන්වා නොමැති බැවිනි.

පැමිණිලිකරු යුධ හමුදා සේවයේ සිටියදී සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් පවත්වන ලද මූලික පරීකෂණ උසාවියකින් පසුව 2009.07.31 දිනැති යුධ හමුදාපතිගේ නිගමනය අනුව පැමිණිලිකරුව යුධ හමුදා සේවයෙන් ඉවත් කිරීමට නියෝග ලැබී ඇති අතර, පැමිණිලිකරු සම්බන්ධ වෙනත් කරුණක් හේතුකොට ගෙන පැමිණිලිකරුව යුධ හමුදා සේවයෙන් ඉවත් කිරීමට වගඋත්තරකරුවන්ට අවස්ථාවක් ලැබී නැති බව නිරීක්ෂණය වේ.

කරුණු එසේ තිබියදී පැමිණිලිකරු ඔහුගේ වසර 22 ක සේවා කාලය සපුරන තෙක් යුධ හමුදා සේවයෙන් විධිමත්ව යොදවා ගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු හා යුධ හමුදාව අතර පැවති එකගතාවය අනුව මේ වන විට පැමිණිලිකරු වසර 22 ක කාලයක් යුධ හමුදාවට සේවය කර ඇත. වසර 22 ක සේවා කාලයක් සපුරන හමුදා සාමාජිකයන්ට අදාළ එකගතාවය අනුව විශ්‍රාම වැටුප් හිමිකම් ද ලැබෙන බව එකගතාවයේ සඳහන් වේ.

**නිගමනය :-**

ඒ අනුව පැමිණිලිකරුට යුද හමුදාව සමග බැදුනු සේවා එකගතාවය අනුව වසර 22 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයෙකු වන බැවිනුත්, මෙකී සේවා කාලය තුල පැමිණිලිකරු සේවයෙන් අස් කර නොමැති බැවිනුත්, පැමිණිලිකරුගේ හිමිකම් දායකත්වය විශ්‍රාම වැටුපට ලබා දී අති බැවිනුත්, පැමිණිලිකරුගේ විශ්‍රාම වැටුප ලබා නොදීමෙන් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හි සඳහන් 'නීතිය පසිඳලීම හා ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය' යන මූලික

අයිතිවාසිකම උල්ලංඝනය කරමින් සිටින බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

**නිර්දේශය :-**

වසර 22 ක යුධ හමුදා සේවා කාලයට අදාළව පැමිණිලිකරු වෙත හිමිවිය යුතු විශ්‍රාම වැටුප ගණනය කොට පැමිණිලිකරු වෙත ගෙවීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 03: 31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද, වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anushya Shanmuganathan**
Commissioner
Human Rights Commission of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

B/